රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**<u>ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල් (ආදායම් මෙහෙයුම් හා නීති ක්‍රියාත්මක කිරීම්) තනතුරට උසස් කිරීම</u>**

සුරාබදු දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී පවතින අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල් (ආදායම් මෙහෙයුම් හා නීති ක්‍රියාත්මක කිරීම්) තනතුරේ පුරප්පාඩු 01 ක් සඳහා සුදුසුකම්ලත් සුරාබදු කොමසාරිස්වරුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්:

   විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කළමනාකරණය, ආර්ථික, සමාජ සංවර්ධන, නීතිය, රසායන විද්‍යාව, බදුකරණය යන විෂය ක්ෂේත්‍රයේ, කවර හෝ විෂයකට අදාළව ශාස්ත්‍රපති හෝ ඊට ඉහළ මට්ටමේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

2. පළපුරුද්ද :
   I. උසස්වීම් සඳහා සුදුසුකම් ලබන දිනට විධායක සේවා ගණයට අයත් දෙපාර්තමේන්තුගත තනතුරක/තනතුරුවල වසර 18 කට නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
   II. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට විධායක සේවා ගණයේ දෙපාර්තමේන්තුගත තනතුරක/තනතුරුවල පළමු ශ්‍රේණියේ වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා පළමු ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වැටුප් වර්ධක 05 ක් උපයාගෙන තිබීම.

3. වයස් සීමාව: අදාල නොවේ.

4. කායික සුදුසුකම් :
   ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

5. වෙනත් :
   I. අයදුම්කරුවන් විශිෂ්ය චරිතයකින් යුක්ත විය යුතු ය.
   II. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.
   III. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ වාර්ෂික කාර්ය සාධනය සතුටුදායක හෝ ඊට ඉහළ මට්ටමක පැවතීම.
   IV. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්න වසර (05) තුළ සතුටුදායක සේවා කාලයක් තිබීම හා විනයානුකූල දඬුවමකට ලක් නොවී තිබීම.
   V. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්න වසර 05 තුළ වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

6. වැටුප් ක්‍රමය :

I. 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි විධි විධානයන්ට අනුව SL-3-2016 වැටුප් පරිමාණය එනම්, රු.88,000 - 2,700 X 12 – 120,400/= (මාසික) මෙම තනතුරට හිමිවන අතර එහි 01 වන පියවර මෙම තනතුරේ ආරම්භක වැටුප් පියවර වේ.

7. බඳවා ගැනීමේ ක්‍රමය:

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින්

අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල් (ආදායම් මෙහෙයුම් හා නීති ක්‍රියාත්මක කිරීම්) තනතුරට උසස් කිරීමට අදාළ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා වූ ලකුණු පරිපාටිය

| අනු අංකය | පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | ලකුණු | උපරිම ලකුණු | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| 1. | සේවා පලපුරුද්ද :<br>(මූලික සුදුසුකම් ලෙස දක්වා ඇති පළමු ශ්‍රේණියේ වසර 05ට අමතරව ඇති සේවා කාලය සඳහා වසරකට ලකුණු 05 බැගින්) | | 25 | අදාළ නොවේ |
| 2 | අධ්‍යාපන සුදුසුකම් :<br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රධානය කරන ආයතනයකින්, මූලික සුදුසුකමට අමතරව ලබා ඇති<br>I. පශ්චාත් උපාධි පාඨමාලාවක් සඳහා<br>II. පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සඳහා | <br><br><br>30<br>15 | 30 | |
| 3 | තනතුරට අදාළ වෘත්තීය සුදුසුකම්:<br>අදාළ දිනට පූර්වාසන්න වසර 05 තුළ රාජ්‍ය ආයතනයකින් හෝ රජය පිළිගත් අධ්‍යයන ආයතනයකින් (උදා: පිළිගත් විශ්ව විද්‍යාලයක්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, පදනම් ආයතනය) ලබා ගත් වෘත්තීය සුදුසුකම් හා දේශීය හෝ විදේශීය සති දෙකකට නොඅඩු පාඨමාලා, පුහුණු හා වැඩමුළු ආදිය සඳහා<br>I. වසරකට නොඅඩු පාඨමාලා සඳහා<br>II. මාස 12 - 06 අතර පාඨමාලා සඳහා<br>III. මාස 06 - 03 අතර පාඨමාලාව සඳහා<br>IV. මාස 03 - සති 02 අතර පාඨමාලාව සඳහා | <br><br><br>20<br>10<br>05<br>2.5 | 20 | |

| | | | | |
|---|---|---|---|---|
| 4 | වෙනත් සුදුසුකම් :-<br>අදාළ දිනට පූර්වාසන්න වසර 05 තුළ තොරතුරු තාක්ෂණය හා භාෂා හැකියාවට (ඉංග්‍රීසි ) අදාළ සහතික සඳහා<br>I. ඩිප්ලෝමා පාඨමාලා සහතිකය<br>II. සහතිකපත්‍ර පාඨමාලා සහතිකය<br>* ඩිප්ලෝමා පාඨමාලාව - මාස 06ක් හෝ පැය 720 කට නොඅඩු විය යුතුය.<br>* සහතික පත්‍ර පාඨමාලාව මාස 03 කට හෝ පැය 360කට නොඅඩු විය යුතුය. | <br><br><br><br>20<br>10 | 20 | |
| 5 | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය:-<br>1. නායකත්වය<br>2. සන්නිවේදන කුසලතා<br>3. වෘත්තීය ආචාරශීලී බව<br>4. ආත්ම විශ්වාසය<br>5. තීරණ ගැනීමේ හැකියාව/ විචක්ෂණශීලී බව | <br>01<br>01<br>01<br>01<br>01 | 05 | |

8. මෙම තනතුරේ පත්වීම ක්‍රියාත්මක වන දිනය සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන අවසාන දිනය වේ.

9. සුදුසුකම් ඇති තම තනතුරේ ස්ථිර කරනු ලැබූවා වූ සුරාබදු කොමසාරිස්වරුන් තමාගේ අයදුම්පත් මීට අමුණා ඇති ආදර්ශ ආකෘති පත්‍රය මගින් 2020.02.14........... දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් පහත දක්වා ඇති ලිපිනයට ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහල කෙලවරේ "අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල් (ආදායම් මෙහෙයුම් හා නීති ක්‍රියාත්මක කිරීම්) තනතුර " යන්න සටහන් කළ යුතුය.

සුරාබදු කොමසාරිස් ජනරාල්
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව,
අංක 353,
කෝට්ටේ පාර,
රාජගිරිය

10. නියමිත දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි.,

ලේකම්,
මුදල් , ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය

දිනය : 2020/01/31

අයදුම්පත් අංකය ..........................

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල් (ආදායම මෙහෙයුම් හා නීති ක්‍රියාත්මක කිරීම) තනතුරට උසස් කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය.

01. කොටස (නිලධාරියා විසින් සම්පූර්ණ කිරීමට)

01. (අ) නිලධාරියාගේ නම:- ..........................................................................................

02. ලිපිනය:-

(I) කාර්යාලීය :- ..........................................................................................
(II) පෞද්ගලික :- ..........................................................................................
(III) ස්ථිර පදිංචිය :- ..........................................................................................

03. (I) උපන් දිනය :- ..........................................................................................
(II) ජාතික හැඳුනුම්පත් අංකය :- ..........................................................................

04. (අ) මුල් පත්වීමේ :-

(I) තනතුර :- ..........................................................................................
(II) පත්වීමේ දිනය :- ..........................................................................................
(III) සේවයේ ස්ථිර කළ දිනය :- ..........................................................................

(ආ) දැනට දරණ තනතුර පිළිබඳ තොරතුරු :-

(I) පත් වූ දිනය :- ..........................................................................................
(II) ස්ථිර කළ දිනය :- ..........................................................................................
(III) සේවා කාලය :- ..........................................................................................

(ඇ.) අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල් (ආදායම මෙහෙයුම් හා නීති ක්‍රියාත්මක කිරීම) තනතුරේ වැඩ බැලීමට පත් කළ දිනය :- ...............

05. ඉල්ලුම් කරන දිනයේ සිට පූර්වාසන්න පස් අවුරුදු කාලය තුල ඔබ:

(I) සියළුම වැටුප් වර්ධක උපයාගෙන තිබේද ? ..........................................................
(නැත්නම් විස්තර කරන්න)

(II) සිදු කර ඇති වරදක් සම්බන්ධයෙන් ඔබ විනයානුකූල දඬුවමකට භාජනය වී තිබේද?
..........................................................................................

06. (අ) ඔබ ලබා ඇති ප්‍රශංසා සහ විශිෂ්ට සේවා සහතික :

(I) ..........................................................................................
(II) ..........................................................................................
(III) ..........................................................................................

(ආ) අදාල වෙනත් සුදුසුකම් (තහවුරු කිරීමට ඡායා පිටපත් ඉදිරිපත් කරන්න)

(i) ..........................................................................................................................
(ii) ..........................................................................................................................
(iii) ..........................................................................................................................

ඉහත සපයා ඇති විස්තර මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට නිවැරදි බව ප්‍රකාශ කරමි. මා මෙම තනතුර සඳහා තෝරා ගත හොත් සුරාබද්ද ආඥා පනතේ නීති රෙගුලාසි වලට අමතරව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පොදු කොන්දේසි වලට එකඟ බවත් සහතික කර ප්‍රකාශ කරමි.

.....................................
අයදුම්කරුගේ අත්සන
දිනය :- 2020.08. ...............

II කොටස

අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

............................................................
අතිරේක සුරාබද්ද කොමසාරිස් ජනරාල් / සුරාබද්ද කොමසාරිස් ජනරාල්
(ආදායම් ප්‍රතිපත්ති හා පරිපාලන)

දිනය : 2020 ..........................................